රහස්‍ය ලේඛනයකි.


උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට
## පස් වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය
## 2018 අගෝස්තු

## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා උපදෙස් සහ
## ලකුණු දීමේ පටිපාටිය

## II පත්‍රය




සියලුම හිමිකම් ඇවිරිණි.

සංශෝධනවලට යටත් ය.

# පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස් වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2018 අගෝස්තු

## II පත්‍රය

## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා උපදෙස් සහ ලකුණු දීමේ පටිපාටිය

### 1. උත්තර පත්‍ර ලකුණු කිරීමේ දී සැලකිය යුතු කරුණු

1.1 සෑම ප්‍රශ්නයක ම නිවැරදි ප්‍රතිචාරයක් සඳහා "✓" ලකුණ ද එයට හිමි ලකුණු ප්‍රමාණය ද වැරදි ප්‍රතිචාරයක් සඳහා "×" ලකුණ ද 00 ද පිටුවෙහි දකුණුපස තීරයෙහි පැහැදිලි ව සටහන් කරන්න.

1.2 එක් එක් පිටුවේ නිවැරදි පිළිතුරු සඳහා වූ ලකුණුවල එකතුව එම පිටුවේ දකුණුපස පහළ කෙළවරේ ඇති **කොටුව තුළ අංක දෙකකින් සටහන් කරන්න.**

1.3 එක් එක් පිටුවේ සටහන් කළ ලකුණුවල එකතුව මුල් පිටුවේ අදාළ පිටු අංකයට ඉදිරියෙන් ඇති කොටුව තුළ සටහන් කරන්න.

1.4 සමස්ත උත්තර පත්‍රය සලකා බලා අත්අකුරු සහ ඉලක්කම් පැහැදිලි ව සහ නිවැරදි ව ලියා ඇත්නම් අමතර ලකුණු දෙකක් ප්‍රදානය කරන්න. එසේ ම අත්අකුරු අපැහැදිලි තත්ත්වයකින් තිබුණත් නිවැරදි ව ලියා ඇත්නම් ලකුණු 01 ක් ප්‍රදානය කරන්න. එම ලකුණු + 02 හෝ + 01 ලෙස පළමු වන පිටුවේත් අට වන පිටුවේත් ලකුණු තීරුවේ සටහන් කරන්න. ලකුණු නොදෙන්නේ නම් ලකුණු + 00 ලෙස සටහන් කරන්න.

1.5 සියලු ම ලකුණුවල එකතුව අවසාන ලකුණ යටතේ ඉලක්කමෙන් සහ අකුරෙන් අදාළ කොටු තුළ ලියන්න.

### 2. ලකුණු පටිපාටිය පිළිබඳ කෙටි විස්තරයක්

2.1 ප්‍රශ්න අංක 1 සිට 15 තෙක් ප්‍රශ්නවල සියලු ම කොටස්වල නිවැරදි පිළිතුරු සඳහා ලකුණු 01 බැගින් ප්‍රදානය කරන්න.

2.2 ප්‍රශ්න අංක 16 සිට 19 තෙක් ප්‍රශ්නවලට ද 21 සිට 26 තෙක් ප්‍රශ්නවලට ද 28 ප්‍රශ්නයට ද නිවැරදි පිළිතුරු සඳහා ලකුණු 02 බැගින් ප්‍රදානය කරන්න.

2.3 ප්‍රශ්න අංක 20, 27 සහ 29 ප්‍රශ්නවල එක් එක් අනු කොටස සඳහා ලකුණු 01 බැගින් ප්‍රදානය කරන්න.

2.4 ප්‍රශ්න අංක 30 සිට 59 තෙක් නිවැරදි පිළිතුර සඳහා ලකුණු 01 බැගින් ප්‍රදානය කරන්න

2.5 ප්‍රශ්න අංක 60 සඳහා (වගන්ති) එක් වගන්තියකට ලකුණු 02 බැගින් ප්‍රදානය කරන්න.

2.6 ප්‍රශ්න අංක 1, 2, 4, 6, 7, 8, 11 පිළිතුරුවල අක්ෂර වින්‍යාසය නිවැරදි ව තිබිය යුතුයි.

2.7 අංක 1(V), 5, 9, 10 ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට **යටින් ඉරක් ගසා තිබිය යුතුයි.** නිවැරදි වචනය ලියා තිබුණහොත් හෝ නිවැරදි වචනය ලියා ඉරි ගසා තිබුණහොත් හෝ ලකුණු නොලැබේ.

2.8 ප්‍රශ්න අංක 12, 13 පිළිතුරුවල සියලුම අකුරු නිවැරදි විය යුතුයි. ඉංග්‍රීසි වචනවල කැපිටල් සිම්පල් මිශ්‍රව ලියා තිබුණ ද ලකුණු ලබා දෙන්න.

2.9 ප්‍රශ්න අංක 14 උපුටා ගැනීමක් නිසා නිවැරදි ව ලියා තිබිය යුතු වේ.

## 3. ලකුණු ලැයිස්තු සකස් කිරීමේ දී සැලකිය යුතු කරුණු

3.1 ලකුණු ලැයිස්තුවේ "ලකුණු එකතුව II පත්‍රය" තීරුවේ ශීර්ෂයෙහි 100 ලෙසට සටහන් කරන්න.

3.2 එක් එක් අපේක්ෂකයාගේ විභාග අංකය ඉදිරියේ, ඊට නියමිත උත්තර පත්‍රයේ සඳහන් අවසාන ලකුණ "ලකුණු එකතුව II පත්‍රය" තීරුවේ සටහන් කරන්න.

3.3 අවසාන ලකුණ ඉදිරියෙන් තීරු දෙකක් ඉතිරි කර, එම ලකුණ පැහැදිලි ව අකුරෙන් ලියන්න.

3.4 ලකුණු ඇතුළත් කිරීමේ දී යම් වරදක් සිදුවුවහොත්, පැහැදිලි ව **තනි ඉරකින් කපා** ඉදිරියෙන් ඇති තීරුවේ ලියා සම්පූර්ණ අත්සන යොදන්න.

3.5 කිසියම් සංශෝධනයක් කරනු ලැබුවහොත්, පළමු වන හා දෙවන පරීක්ෂකවරුන්ගේ සම්පූර්ණ අත්සන යොදා එය සනාථ කරන්න.

3.6 සංශෝධනයක් කරනු ලබන සෑම අවස්ථාවක දීම ලකුණු ලැයිස්තුවත් පිළිතුරු පත්‍රයත් ප්‍රධාන පරීක්ෂකට පෙන්වා ඔහුගේ/ඇයගේ අත්සන ද ලබා ගන්න.

3.7 සෑම සංශෝධනයක් ම, ලකුණු ලැයිස්තුවේ පසුපිටෙහි "වෙනත් කරුණු" සඳහා වෙන් ව ඇති ස්ථානයේ ද සටහන් කර සම්පූර්ණ කරන්න.

3.8 සෑම ලකුණු ලැයිස්තුවක් ම ලකුණු ඇතුළත් කළ පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කළ පරීක්ෂක (EMF) සහ ප්‍රධාන පරීක්ෂක විසින් ස්වකීය සංකේත අංක සහ අත්සන් යොදා සහතික කර තිබීම අනිවාර්ය වේ.

**පිළිතුරු පත් ලකුණු කිරීමේ දීත් ලකුණු ලැයිස්තු පිළියෙල කිරීමේ දීත් පිරිසිදු ව, පැහැදිලි ලෙස, සම්මත ආකාරයට කටයුතු කිරීමට සැලකිලිමත් විය යුතු ය.**

**උත්තර පත්‍රයක හෝ ලකුණු ලැයිස්තුවක හෝ යම් වෙනසක් සිදු කරන්නේ නම් එය පළමු පරීක්ෂක විසින් ම සිදු කළ යුතු ය. නමුත් ඒ සියල්ල ප්‍රධාන පරීක්ෂකගේ අනුමැතිය ඇති ව කළ බවට ප්‍රධාන පරීක්ෂකගේ අත්සන ද යෙදිය යුතු අතර ගණිත පරීක්ෂක හා උත්තර පත්‍රය පරීක්ෂා කළ දෙවන පරීක්ෂකගේ ද කෙටි අත්සන යෙදිය යුතු ය.**

# II පත්‍රය

## ලකුණු දීමේ පටිපාටිය


| ප්‍රශ්න අංකය | | පිළිතුරු | ලකුණු |
|---|---|---|---|
| 1. | (i) | බත්/රොටී/අල/අලවර්ග | 1 |
| | (ii) | 1. වර්ධක/වර්ධක ආහාර/වර්ධක ආහාර කාණ්ඩය<br>2. ආරක්ෂක/ආරක්ෂක ආහාර/ආරක්ෂක ආහාර කාණ්ඩය | 1<br>1 |
| | (iii) | අයත්/අඩංගු | 1 |
| | (iv) | පිරිසිදු ජලය/පිරිසිදු ජලය ප්‍රමාණවත් ව | 1 |
| | (v) | (i) නීරෝගී පැවැත්ම සඳහා සුදුසු ආහාර පාන | 1 |
| 2. | (i) | සෝදිසියෙන් ඉන්නවා/ අවධානයෙන් ඉන්නවා/විමසිල්ලෙන් ඉන්නවා /සෙවිල්ලෙන් ඉන්නවා/අවධානයෙන් බලාගෙන ඉන්නවා/උවමනාවෙන් බලාගෙන ඉන්නවා | 1 |
| | (ii) | නිශ්ශබ්ද ව ඉන්නවා/කථා නොකර ඉන්නවා/නිහඬ ව ඉන්නවා | 1 |
| 3. | (i) | ඔබේ පුතා කෝ ? | 1 |
| | (ii) | හෙට එනවා කියූ ඔබ අදම ඇවිත් ! | 1 |
| 4. | | උදෑසන/උදෑසනෙහි/උදේ/උදයෙහි/අලුයම/අලුයම් කාලයෙහි/ පාන්දර/හිමිදිරියේ/හිරු උදා වන විට අහසෙහි රක්ත වර්ණය ඇති වේලාවෙහි | 1 |
| 5. | (i) | නඟයි | 1 |
| | (ii) | කළෝය | 1 |
| 6. | (i) | එළදෙන්නු තණකොළ කැවෝය./කෑහ. | 1 |
| | (ii) | අපි සරුංගල් යැවීමට පිට්ටනියට ගියෙමු. | 1 |
| 7. | | ඉණිමං | 1 |
| 8. | | දියඹට වැටුණු සඳකිරණින් සාගරය බැබලෙන්නට විය. | 1 |
| 9. | | පැළැටි | 1 |
| 10. | | පාඨකයා | 1 |
| 11. | | විරිත් | 1 |
| 12. | (i) | සෙල්ලම් පිටිය/සෙල්ලම් පිට්ටනිය/ක්‍රීඩා පිටිය/ක්‍රීඩා පිට්ටනිය. | 1 |
| | (ii) | යහළුවා/යෙහෙළිය/මිත්‍රයා/මිතුරා/මිතුරිය/සගයා/සකි | 1 |
| 13. | (i) | PENCIL / Pencil / pencil | 1 |
| | (ii) | BICYCLE / Bicycle / bicycle | 1 |
| 14. | (i) | That is a mango tree | 1 |
| | (ii) | I am drinking water | 1 |

| ප්‍රශ්න අංකය | | පිළිතුරු | ලකුණු |
|---|---|---|---|
| 15. | (i) | අඹ ගස | 1 |
| | (ii) | උංගල් වයදූ එත්තනෙයි<br>උංගල් උඩය වයදූ එත්තනෙයි<br>උංගලුක්කු වයදූ එත්තනෙයි/උංගලුක්කු එත්තනෙයි වයදූ | 1 |
| 16. | | 2367 | 2 |
| 17. | | 2560, 2605, 3506, 3650 | 2 |
| 18. | (i) | 56 | 2 |
| | (ii) | 64 | 2 |
| 19. | | 192 | 2 |
| 20. | (i) | 101 | 1 |
| | (ii) | 2 | 1 |
| 21. | (i) | 3603 | 2 |
| | (ii) | 1142 | 2 |
| 22. | | පැය 8 මිනිත්තු 30 | 2 |
| 23. | | 5 වාරයක් / පස් වාරයක් / 5 | 2 |
| 24. | | 116 | 2 |
| 25. | | 250 | 2 |
| 26. | | $\frac{6}{10}$ | 2 |

27.

| ද්‍රව්‍යය | 1 kg ක මිල | | ප්‍රමාණය | මිල | | ලකුණු |
|---|---|---|---|---|---|---|
| | රුපියල් | සත | | රුපියල් | සත | |
| සීනි | 120 | 00 | 500 g | 60 | 00 | |
| ජෝ කොළ | 850 | 00 | 100 g | 85 | 00 | 1 |
| කිරි පිටි | 600 | 00 | 250 g | 150 | 00 | 1 |
| මුළු මුදල | | | | 295 | 00 | 1 |

| ප්‍රශ්න අංකය | | පිළිතුරු | ලකුණු |
|---|---|---|---|
| 28. | | 12.45/ දොළහ පසුවී මිනිත්තු හතළිස් පහයි/එකට කාල යි/<br>දොළහයි හතළිස් පහයි. | 2 |
| 29. | (i) | ප්‍රස්තාරයේ නිවැරදි දක්වීම (සීමාව ලකුණු කර අඳුරු කර තිබිය යුතු ය.) | 1 |




| | | | |
|---|---|---|---|
| | (ii) | අඹ | 1 |
| | | 13 | 1 |

| ප්‍රශ්න අංකය | පිළිතුරු | ලකුණු |
|---|---|---|
| 30. | (1) දුම්මල, මා වේවැල්, බිං කොහොඹ | 1 |
| 31. | (2) කදුරු, හොර, කජු | 1 |
| 32. | (2) වවුලන් ශාකවල බීජ තැන තැන දැමීම යි. | 1 |
| 33. | (3) දළඹුවා | 1 |
| 34. | (3) හික්මීයා | 1 |
| 35. | (4) පාචනය | 1 |
| 36. | (3) කොළරාව | 1 |
| 37. | (3) රටකජු | 1 |
| 38. | (3) C | 1 |
| 39. | (1) සිකුරු ය. | 1 |
| 40. | (2) හොඳින් වාතාශ්‍රය ලබාදීමයි. | 1 |
| 41. | (1) මුල් මගිනි. | 1 |
| 42. | (3) තෙල් සිඳීමට ය. | 1 |
| 43. | (4) ජලය දැමූ භාජන මත මල් දැමීමයි. | 1 |
| 44. | (3) වේයා | 1 |
| 45. | (2) අත් පන්දු | 1 |
| 46. | (1) මැස්සෝක්කා සහ නිවිති | 1 |
| 47. | (4) සතුන්ගෙන් වගා රැකගැනීමට යොදා ගැනෙන ඇටවුමකි. | 1 |
| 48. | (1) A බල්බය පමණි. | 1 |
| 49. | (3) තියුණු ඉව | 1 |
| 50. | (3) පහළට බෑවුම් සහිත පාර ඉදිරියෙනි. | 1 |
| 51. | (1) පුන් කලස | 1 |
| 52. | (4) ඩැහි අඩුව | 1 |
| 53. | (3) වීදුරුවෙන් වායු බුබුළු පිටවන බවයි. | 1 |
| 54. | (4) ත්‍රිකුණාමලය සහ අම්බලන්තොට වේ. | 1 |

| ප්‍රශ්න අංකය | පිළිතුරු | ලකුණු |
|---|---|---|
| 55. | (2) කඹ ඇදීමයි. | 1 |
| 56. | (2) පහසුවෙන් සිටීමයි. | 1 |
| 57. | (3) C, B, A, D | 1 |
| 58. | (4) සරුංගලයක් යැවීම | 1 |
| 59. | (4) ශ්‍රී ලංකා තැපැල් සේවයයි. | 1 |
| 60. | **නිවැරදි වාක්‍ය 03**<br>**වගන්ති සඳහා උපදෙස්**<br>(i) සෑම වාක්‍යයක් ම වචන පහකට (05) නොඅඩු විය යුතු ය.<br>(ii) උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතු ය.<br>(iii) අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.<br>(iv) මාතෘකාවට අදාළ විය යුතු ය.<br>(v) ලිඛිත භාෂාවෙන් ලියන ලද වැකි විය යුතු ය.<br>(vi) වැකියේ අදහස නිවැරදි විය යුතු ය.<br>(vii) එක ම අදහස නැවත නැවත ලිවීම සිදු නොවිය යුතු ය.<br><br>**වැකියකට එක් ලකුණක් පමණක් ප්‍රදානය කිරීම පිළිබඳ ව උපදෙස්**<br>වැකියේ එක් වචනයක අකුරක අඩුපාඩුවක් හෝ පිල්ලමක අඩුවක් හෝ වේ නම් ලකුණු 01 කි.<br>(එකට වැඩි අඩුපාඩු වේ නම් ලකුණු නොලැබේ.) | $2 \times 3 = 06$ |

| | | | |
|---|---|---|---|
| 1 | —— 15 | ලකුණු | 28 |
| 16 | —— 29 | ලකුණු | 34 |
| 30 | —— 59 | ලකුණු | 30 |
| 60 | —— | ලකුණු | 06 |
| | | අතිරේක ලකුණු | 02 |
| | | මුළු ලකුණු | 100 |

සිසුන් විසින් ලියා එව තෝරාගත් වගන්ති.

01. එහි දී ලස්සනම චිත්‍රය තෝරීම කළේ මමයි.

02. මට මගේ මිතුරන් ද එහි දී හමුවුණේ ය.

03. එවිට මම යහළුවන් සමග සතුටින් සිටියෙමි.

04. චිත්‍ර තරඟයෙන් පළමුවැනියා වූ මම චිත්‍ර ප්‍රදර්ශනය නැරඹීම සඳහා ජනාකායේ යාමට ඇඟිලි ගනිමින් සිටියෙමි.

05. එහිදී මම වෙනදාට වඩා බොහෝ සතුටට පත් වුණෙමි.

06. නැවතත් මෙවැනි තරඟයකින් ජයග්‍රහණය කර පිටරටකට පැමිණෙනවා කියා මම එවිට අධිෂ්ඨාන කර ගත්තෙමි.

07. මා හට එම ආරාධනාව ලැබුණ විට මම ඉමහත් සතුටට පත්වුණෙමි.

08. මම චිත්‍ර ප්‍රදර්ශනය නැරඹීමට යන දවස පැමිණෙනතුරු නොඉවසිල්ලෙන් සිටියෙමි.

09. චිත්‍ර තරඟයකින් මම පළමුවැන්නා කියා ලිපියක් එවා තිබූ පසු මට කියා ගන්න බැරි තරම් සතුටක් දැනුණි.

10. මා ලද ජයග්‍රහණයෙන් ඔෂයන් අතර මා පැසසුමට ලක් වෙතැයි මට සිතුණි.

11. මා ලැබූ ජයග්‍රහණයෙන් මගේ පාසලට ද මගේ දෙමව්පියන්ට ද ඉතා සතුටට පත් වෙතැයි සිතුණි.

12. මම ජනාකායට ගොස් එහි ඇති දේ දැක ගැනීමට ආශාවෙන් සිටිමි.

13. මා චිත්‍ර තරඟයකින් ප්‍රථමයා වූ බව දැනගත් විගස මම මහත් සතුටට පත් වුණෙමි.

14. මගේ දෙමව්පියන් කොපමණ සතුටට පත් වේදැයි මට සිතා ගත නොහැකි විය.

15. තවත් එවැනි ජයග්‍රහණ ලබා ගත් මගේ පාසල රටේ හොඳම පාසල කිරීමට මම සිතා ගත්තෙමි.

16. විචිත්‍ර වර්ණයෙන් යුත් අලංකාර සිතුවම් අතරින් මා ගමන් කරන විලාසය මගේ සිතෙහි චිත්‍රයක් මෙන් ඇඳිණි.

17. චිත්‍ර ප්‍රදර්ශනය නරඹා ජපානයේ සුන්දර ගින්ක -ජු නැරඹීමට ද මම සිතුවෙමි.

18. මගේ මිතුරන් සැමටම වටිනා තෑගි ගෙන ඒමට මම සිතා ගත්තෙමි.

19. මගේ රටට කීර්තියක් ගෙන දීම ගැන මගේ සිතට ආඩම්බරයක් දැනුණි.

20. මේ ජයග්‍රහණය සඳහා අම්මාට පළමුවෙන් ම ස්තුතිවන්ත විය යුතු යැයි මට සිතුණි.

21. ගුවන් යානයෙන් ජපානය බලා පිටත් ව යන අයුරු මට මැවී පෙනුණි.

22. මේ ගමනේදී ජපානයේ සිටින මගේ මාමා ද හමුවීමට හැකි වෙතැයි මට සිතුණි.

23. මගේ ජයග්‍රහණය ගැන ඇසූ විගස ම ඒ ගැන දෙමාපියන්ට පැවසීමට මම නොඉවසිලිමත් වීමි.

24. ජපානයේ ටෝකියෝ නුවර පුරා ම නිදහසේ ඇවිදීමට මම බලාපොරොත්තු වෙමි.

25. ගුවන් යානයෙන් ජපානය බලා යනවිටදී අවට සුන්දරත්වය නැරඹීමට මම අදිටන් කර ගතිමි.